සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

**තෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2023**
**Third Term Test - Grade 06 - 2023**

## නර්තනය

**පැය 1. වි. 30**

නම / විභාග අංකය:

### I කොටස

- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 01 සිට 06 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

01. නර්තනයේ මූලික ඉරියව්ව ............................................... නමින් හැඳින්වේ.
    (i) දණ්ඩියම (ii) මණ්ඩිය
    (iii) කස්තිරම (iv) ගී මණ්ඩිය

02. ''කුද ගත ගත දොම්'' බෙර පදය යොදා ගනු ලබන්නේ ............................................... වන්නම සඳහාය.
    (i) තුරඟා (ii) වෛරෝඩි
    (iii) හනුමා (iv) සිංහ රාජ

03. ඉද්ද, සමන්, පිච්ච, කැකුළු යන පද ප්‍රස්ථාර කළ හැකි තාල රූපය නම් ...............................................
    (i) මාත්‍රා 2+2 තාල රූපයයි (ii) මාත්‍රා 4+4 තාල රූපයයි
    (iii) මාත්‍රා 2+3 තාල රූපයයි (iv) මාත්‍රා 3+3 තාල රූපයයි

04. නර්තනයේ දී වැලමිට, උරබාහු, බෙල්ල, දණහිස යන ශාරීරික කොටස් යොදා ගනු ලබන්නේ ................................. කොටසයි.
    (i) ප්‍රත්‍යංග (ii) උපාංග
    (iii) අංග (iv) අංග හා උපාංග

05. ''පාන්දරින් ස්කෝලෙට ටැංටු කරත්තෙන්'' යන ගීතය සඳහා සංගීත නිර්මාණ කරනු ලැබුවේ .......................................... මහතාය.
    (i) සෝමතිලක දිසානායක (ii) සුනිල් දයානන්ද කෝනාර
    (iii) සුනිල් ආරියරත්න (iv) හර්ෂණ දිසානායක

06. ............................................... උඩරට නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රවීණ නර්තන ශිල්පියෙකි,
    (i) සව්රිස් සිල්වා මහතා (ii) සිරිබෝහාමි මහතා
    (iii) හීන් නිලමේ ගුරුතුමා (iv) නිත්තවෙල ගුණයා මහතා

- අංක 07-10 දක්වා ප්‍රශ්නවලට අදාල පිළිතුර ප්‍රහේලිකාව තුළ ලියන්න.

පහලට

07. උද්‍යාන පරිසරයේ සුන්දරත්වය දැකීමෙන් සිතේ පහළවන භාවයකි.
08. පිඹීමෙන් හඬ උපදවා ගැනීමට සකස් කර ගන්නා විකල්ප වාද්‍ය උපකරණයකි.

හරහට

09. පරිසරයේ මල්ගොමු අතර පියඹා යන සත්වයකි.
10. හනුමා වන්නමෙන් වර්ණනා කෙරෙණ සත්වයා මේ නමින් හැඳින්වේ.

| | | | | |
|---|---|---|---|---|
| 9 7 ස | | 8 න | | |
| | ■ | | ■ | ■ |
| | ■ | 10 ව | | |

● **ප්‍රශ්න අංක 11-15 තෙක් ප්‍රශ්න සඳහා A කොටසට ගැලපෙන පිළිතුරු B කොටසින් තෝරා යා කරන්න.**

| | A | B |
|---|---|---|
| 11. | සෙම්බු නර්තනය | කැරොල් ගීත |
| 12. | ගැට බෙරය | සබරගමු |
| 13. | තෙයිකිට තෙයි තාම් | කළගෙඩිය |
| 14. | මහ බඹා කෝලම | සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ |
| 15. | නත්තල් උත්සවය | පා සරඹ |

● **අංක 16-20 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු වරහන් තුළින් තෝරා හිස් තැන් මත ලියන්න.**

16. නර්තනයට අවශ්‍ය ඉරියව් (හැඩතල) නිවැරදි කර ගැනීම සඳහා ........................................... කිරීම වැදගත් වේ.
17. තාල තැබීම ........................................... තැබීම යනුවෙන්ද හැඳින්වේ.
18. වෙස් ඇඳුම් කට්ටලය භාවිතා කරනු ලබන්නේ ........................................... නර්තන සම්ප්‍රදායේය.
19. සමන් දේවාල පෙරහැර උත්සවය නිමා කරනු ලබන්නේ ........................................... නැටීමෙනි.
20. තෛපොංගල් උත්සවය ........................................... පූජෝපහාර සඳහා පැවැත්වේ.

(හිරු දෙවියන්ට, නම්‍යතා අභ්‍යාස, ගරායකුම, උඩරට, අසාතය)

# නර්තනය - 6 ශ්‍රේණිය

**II කොටස**

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.**

**01. ඔබ පංති කාමරයේ දී ගොඩ නගා ගත් ලී කෙළි හෝ කළ ගෙඩි නර්තන කණ්ඩායම් ක්‍රියාකාරකම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(i) ලී කෙළි / කළ කණ්ඩායම් ක්‍රියාකාරකම සඳහා යොදාගත් කවියක් ලියන්න. (ල. 2)

(ii) එම ක්‍රියාකාරකම සඳහා භාවිතා කළ රංග උපකරණය ලියන්න. (ල. 2)

(iii) සිංහල ලී කෙළි හා කළ යන ගැමි නැටුම් අංග දෙකට සමාන ද්‍රවිඩ ගැමි නැටුම් අංග දෙක ලියන්න.

ලී කෙළි ........................................................

කළ ........................................................ (ල. 2)

(iv) ඔබ කණ්ඩායම් නර්තනයෙන් අත්පත් කරගත් යහපත් ගුණාංග 02 ක් ලියන්න. (ල. 4)


**02.** (i) තනි තිතේ ප්‍රභේද නම් කරන්න. (ල. 3)

(ii) මාත්‍රා 2+2 තාල රූපයට රබන් පදයක් ලියා දක්වන්න. (ල. 3)

(iii) ''එක පඳුරෙන් ලී සයක් කපාගෙන'' යන කවි පදය නිවැරදි තාල රූපයට ප්‍රස්තාර කරන්න. (ල. 4)

**03. පහත සඳහන් රූප සටහන් ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A



B



C



(i) A රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය නම් කරන්න. (ල. 3)

(ii) B රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය නම් කරන්න. (ල. 3)

(iii) C රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ල. 4)

**04.** (i) පහත නම්කර ඇති නර්තන ශිල්පීන් තිදෙනා අයත්වන නර්තන සම්ප්‍රදායන් නම් කරන්න.

1. එච්. එස්. සව්රිස් සිල්වා මහතා
2. එන්. එස්. සිරිබෝහාමි මහතා
3. නිත්තවෙල ගුණයා ගුරුන්නාන්සේ (ල. 3)

(ii) ඉහත සඳහන් ඔබ කැමති නර්තන ශිල්පියෙක් තෝරාගෙන ඔහු විසින් නර්තන කලාව සඳහා ඉටුකළ සේවාවන් ලියා දක්වන්න. (ල. 3)

(iii) දේශීය නර්තන සම්ප්‍රදායන් සුරැකීම සඳහා ඔබ කරන යෝජනා 2 ක් ලියන්න. (ල. 4)

05. ● පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු වගුව ඇසුරින් සම්පූර්ණ කරන්න.

● හිස්තැන්වලට අදාල නිවැරදි පිළිතුර ලියන්න.

| ආගමික උත්සවය | පැවැත්වීමේ හේතුව නම් කරන්න | යොදාගත් සැරසිල්ලක් නම් කරන්න | උත්සවය හා බැඳි සාරධර්මයක් නම් කරන්න |
|---|---|---|---|
| තෛයිපොංගල් උත්සවය | i ........................................ | iii ........................................ | සූර්යයාට කළගුණ දැක්වීම |
| වෙසක් උත්සවය | ii ........................................ | වෙසක් කූඩු සැරසීම | v ........................................ |
| නත්තල් උත්සවය | කිතුනු උපත සිහි කිරීම | iv ........................................ | අසරණ අයට තෑගි භෝග ලබා දීම |

(ල. 2×5=10)